සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

මැයි 01 සතිය

ශ්‍රේණිය - 10 (II වාරය)

සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 1.1.4. මානව හා සත්ත්ව රූප ඇතුළත් පරිසරය පුළුල්ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි**

**ජන ක්‍රීඩාවක සිත්ගත් අවස්ථාවක්**

1. ඉගෙනුම් ආධාරක






2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- දී ඇති පින්තූර හොඳින් නිරීක්ෂණය කර එහි දැකිය හැකි ක්‍රීඩා ඉරියව් වල ඇති ක්‍රියාශීලී බව තරගකාරී බව අවබෝධයෙන් ක්‍රියාකාරකමෙහි නිරතවන්න.
- පරිකල්පන ශක්තිය දියුණු කර ගැනීමට මනසේ මවාගත් රූ සිතුවමට නැගීමට උත්සාහ ගන්න.
- ඔබ දැක ඇති ජන ක්‍රීඩා තරගයක තිබූ උද්වේගකාරී ස්වභාවය සිතුවමට යෙදීමට උත්සාහ ගන්න.
- එක් එක් ක්‍රීඩාවන්ට අදාළ ඇඳුම් පැළඳුම් පිළිබඳව ඔබට ඇති අවබෝධයක් ලබා ගන්න.
- වර්ණ කිරීම සඳහා සුදුසු වර්ණ මාධ්‍යයක් තෝරා ගන්න
- වර්ණ යෙදීමේදී ක්‍රීඩාවේ ඇති උද්වේගකාරී බව වර්ණ මාධ්‍යයෙන් ප්‍රකාශ කිරීමට උත්සහ කරන්න

**පර්යාවලෝකය - ළඟ ඇති වස්තූන් විශාලවත් දුර ඇති වස්තූන් ඈතට යන විට කුඩාවටත් පෙනීම.**

3. ඇගයීම

- දී ඇති සිතුවම් හොඳින් අධ්‍යයනය කරන්න
- ක්‍රීඩා කරන ක්‍රීඩකයන්ගේ විවිධ ඉරියව්වල දළ සටහන් නිමර්ාණය කරන්න
- එම දළ සටහන් සම්පිණ්ඩනය කර චිත්‍රය නිර්මාණය කරන්න
- තේමාවට අදාළ පරිසරය හා පසුබිම සකස් කරන්න
- උචිත වර්ණ මාධ්‍යයක් තෝරා ගන්න